# 4. ෆික්හුල් උස්රා

## 4.1 ඉස්ලාමීය පවුල් ජීවිතය

- විවාහය මිනිසා පාප ක්‍රියාවන්වලින් ආරක්ෂා කරයි.
- මිනිස් ප්‍රජනනය සඳහා වූ නිකාහය සඳහා අවශ්‍ය විධි විධානයන් ඉස්ලාමයේ පෙන්වා දී ඇත.
- මනමාලියගේ භාරකරු හා සාක්ෂිකරුවන් ඉදිරියේ විවාහය සිදු විය යුතුයි. මේ හැර සිදුවන්නා වූ විවාහය ඉස්ලාමීය විවාහයක් ලෙස නොසැලකේ.
- විවාහ වීමට අනුමැතිය ඇති අය හා අනුමැතිය නැති අය හඳුනා ගැනීම අනිවාර්ය වේ.

විවාහය යනු හදවත් දෙකක් එක් කරන්නා වූ ශක්තිමත් බන්ධනයක් වේ. එහි සෙනෙහසකින් යුත්, කරුණාව හා පිවිතුරු ආදරය බැබළේ. ආදරය හා රම්‍යභාවය ඇති මෙම නිවසෙහි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට සතුට, සිත් සැනසීම හා ආරක්ෂාව යන දයාද සියල්ලම සම්පූර්ණයෙන් ම ලැබේ. මේ හේතුව මත අල්ලාහ් හදවත් දෙකක් අතර විවාහ බන්ධනය ඇති කරයි. මිනිස් සංහතියේ වර්ධනයේ පිවිතුරු භාවය, විවාහය තුළින් ලැබෙන්නා වූ ප්‍රතිඵලයක් වේ. තව ද ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් විවාහය යනු සැනසීම උද්යෝගය හා සතුට යනාදිය ඇතිකරන්නා වූ සම්බන්ධතාවයක් වේ. මෙම අදහස තහවුරු කරමින් අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි.

"තවද ඔබ ඔවුන්ගෙන් සැනසීම ලබාගැනීම පිණිස, බිරිඳ ඔබ තුළින් ම ඔබ වෙනුවෙන් ඔහු මවා තිබීම ද, ඔබ අතර ආදරය හා අනුකම්පාව උදවී තිබීම ද, ඔහුගේ සළකුණු වලින් ඇත්තකි. සිහිබුද්ධියෙන් දැන ගත හැකි සමාජයට නිසැකයෙන් ම මෙහි සළකුණු ඇත. (30:21)

කිසිදු පිරිමියෙකුට හෝ ස්ත්‍රියකට විවාහයෙන් තොරව හුදකලාව ජීවත්වීමට අනුමත කර නැත. බොහෝ අවස්ථාවල දී ඉස්ලාම් මෙකී පවුල් ජීවිතය කෙරෙහි, විවාහය පොළඹවා, අනිවාර්ය කරයි. මේ පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසුහ.

"තරුණයෙනි, ඔබ අතරින් ශක්තිමත් අය විවාහ වන්න. මන්ද යත් එය බැල්ම පාලනයකර ගැනිමටත්, රහස් අවයවයන් ආරක්ෂා කරගැනීමටත් ඉවහල් වේ. ශක්තිය නැති අය සව්ම් සමාදන් වන්න. එය ඔහුට ආරක්ෂාවකි. (බුහාරි)

## අභ්‍යාස

1. ඉස්ලාම්, ස්ත්‍රී පුරුෂ බැඳීම කෙලෙස ගරු කරන්නේ ද?
2. සැමියා හා භාර්යාවගේ යුතුකම්, අයිතිවාසිකම්, ලේඛන ගත කරන්න.
3. ඉස්ලාමීය පවුල් ජීවිතය පිළිබඳ හදීස්, කුර්ආන් වාක්‍යයන් ලියන්න.
4. විවාහය මගින් ලැබෙන උතුම් තත්ත්වය පිළිබඳ ඉස්ලාම් පවසන අදහස් ලියන්න.


## 4.2 "අන් නිකාහ් " විවාහයේ වැදගත්කම

විවාහය යහපත් පෙළපතක් ඇති කරයි. පාපී ක්‍රියාවන් වලින් වළක්වා භයානක සමාජ රෝගවලින් ආරක්ෂා කරයි. මිනිසා යම් ස්වයං පාලනයක් යටතට පත් කිරීමට විවාහය උපකාරී වේ. මේ නිසා ඉස්ලාමීය දෘෂ්ටිකෝණයේ විවාහය එක්තරා ඉබාදතයකි. මේ සඳහා අල්ලාහ්තආලා විසින් සමහර නීතිරීති ද පනවා ඇත. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ විවාහ වන ලෙස බලකරමින් ද, එය ප්‍රතික්ෂේප කරන්නන්ට අනතුරු අඟවමින් ද මෙසේ පැවසුහ.

"විවාහය මාගේ සාම්ප්‍රදායකි. (සුන්නත්) තවත් හදීසයක, කවරෙක් මාගේ සාම්ප්‍රදාය (සුන්නත්) නොසළකා හරින්නේ ද ඔහු මට අයත් කෙනෙක් නොවේ" යන්නෙන් නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමා,පැවසු බව අනස් රලියල්ලාහු අන්හු තුමා වාර්තා කරයි. (මුස්ලිම්)

මේ අනුව විවාහය යනු නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන්ගේ සාම්ප්‍රදායක් (සුන්නත්) වන බව හඳුනා ගත යුතු ය.

මෙකී විවාහයේ නීති රීති ද, සලකා විවාහ කිරීම ද වැදගත් වේ. විවාහ වීමේ දී අජ්නබි වන (අන්‍ය) ස්ත්‍රී පුරුෂයින් පමණක් එකිනෙකා විවාහපත් වීමට අනුමැතිය ඇත. මහ්රම් වන අය විවාහ වීමට අනුමැතිය නොලද අය වේ.



## විවාහ ගිවිසුම

විවාහය එක්තරා ගිවිසුමකි. එය ප්‍රසිද්ධ කළ යුතු ය. ඊට අදාළ කොන්දේසි ඉටු කරමින්, විවාහය සිදු කළ යුතු ය. "එක් මුස්ලිම්වරයෙකු විවාහ විය යුත්තේ එක් මුස්ලිම් කාන්තාවක් ය" යන පොදු කොන්දේසිය මත පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

- මනාලියගේ වලී (භාරකරු)
- ඊජාබ් (භාර කිරීම/ පැවරීම)
- කබූල් (භාර ගැනීම)
- සාක්ෂි දෙදෙනෙක්.

## "වලී" (භාරකරු)

යම් කාන්තාවක් ව විවාහ කර දීමට අයිතිය ඇති තැනැත්තා වලී වේ. පහත සඳහන් අය වලී ලෙස පෙනී සිටිය හැකි ය.

1). පියා.
2). පියාගේ පියා.
3). එක් කුස උපන් සහෝදරයා.
4). පියා පසින් උපන් සහෝදරයා.
5). එක් කුස උපන් සහෝදරයාගේ පුතා.
6). පිය පස සහෝදරයාගේ පුතා.
7). පියාගේ එක් කුස උපන් සහෝදරයා.
8). පියාගේ එක් කුස උපන් සහෝදරයාගේ පුතා.
9). කාළී (විනිශ්චයකරු)

ඉහත සඳහන් කළ වලී වරුන් පිළිවෙළින් එක් අයෙක් නොමැති වූ විට අනෙකා වලී වශයෙන් පෙනී සිටිය හැක. වලී වශයෙන් පෙනී සිටින තැනැත්තා පහත සඳහන් සුදුසුකම් ඇත්තෙක් විය යුතු ය.

1). මුස්ලිම්වරයෙක් වීම.
2). වැඩිවියට පත් ව සිටීම.
3). සිහිබුද්ධිය තිබීම.
4). ස්වාධීන පුද්ගලයෙක් වීම.
5). පාපකර්මවල යෙදෙන කෙනෙක් නොවීම.
6). පිරිමියෙකු වීම.

## ඊජාබ් (භාර දීම) කබූල් (භාර ගැනීම)

වලී වරයා නියමිත වචනයන් ප්‍රකාශ කර විවාහ කර දීම ඊජාබ් යනුවෙන් ද, එය පිළිගැනීම කබූල් වශයෙන් ද හැඳින් වේ.

## සාක්ෂිකරුවන්

විවාහ ගිවිසුම සිදුවන අවස්ථාවේ දී අවම වශයෙන් සාක්ෂිකරුවන් දෙදෙනෙක් සිටීම අනිවාර්ය වේ. ඔවුන්ට තිබිය යුතු සුදුසුකම් අතරින් වලී සඳහා තිබිය යුතු සුදුසුකම්වලට අමතරව පහත සඳහන් සුදුසුකම් දෙක ද තිබිය යුතු ය.

1). විවාහ ගිවිසුම සිදුකරන්නා වූ භාෂාව පිළිබඳ අවබෝධයක් තිබීම.
2). ගොළු, බිහිරි හා අන්ධ වැනි අඩුපාඩු වලින් තොර වූ කෙනෙක් වීම.

## මහර්

විවාහය සිදුවන අවස්ථාවේ දී මනමාලයා විසින් මනාලියට ස්ව කැමැත්තෙන් දෙනු ලබන මුදල හෝ භාණ්ඩය "මහර්" ලෙස හඳුන්වමු. මේ පිළිබඳව අල්කුර්ආන් මෙසේ අවධාරණය කරයි.

"ඔබ ස්ත්‍රීන්ට ඔවුන්ගේ මහර්ය සතුටින් ලබා දෙන්න." (04.04)

## වලීමා

විවාහයෙන් පසුව මනමාලයා විසින් දෙනු ලබන සංග්‍රහය වලීමා වේ. මෙය සුන්නත් වූ ක්‍රියාවකි. මෙම සංග්‍රහය ඉටු කරන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සහාබාවරුන් ව උනන්දු කර ඇත. නමුත් මෙහි නාස්ති කිරීම හරාම් වේ. මෙම අවස්ථාවට ධනවතුන් පමණක් නොව දුප්පත් අයට ද, අසල්වැසියන්ට ද, මිත්‍රයින්ට ද, ඥාතීන්ට ද ආරාධනා කිරීම වඩාත් වැදගත් වේ.

### ක්‍රියාකාරකම

1). විවාහයේ වැදගත්කම පිළිබඳ විස්තර කරන්න.
2). විවාහ නොවී සිටීමෙන් ඇතිවන විපාක සඳහන් කරන්න.
3). මහ්රම් පිළිබඳව සටහනක් ලියා විස්තර කරන්න.
4). දෑවැද්ද තුරන් කර මහර් ලබා දී විවාහ කරන්නා වූ සමාජයක් ඇති කිරීම පිණිස කුමක් කළ යුතුදැයි විස්තර කරන්න.

## 4.3 බහු භාර්යා විවාහය

- බහු භාර්යා විවාහය කොන්දේසි මාලාවක් මත අනුමැතිය ලද්දක් මිස අනිවාර්ය වූ එකක් නොවේ.
- විවිධ හේතූන් මත නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ බහු විවාහයන් කරගත්හ.
- අල්කුර්ආනය හා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ජීවිතය දැනගත් කෙනෙකු බහු භාර්යා විවාහය ගැන දෙස් නොපවසති.
- ඉස්ලාමයට පෙර තිබුණා වූ අවිධිමත් බහුභාර්යා විවාහය විධිමත් ක්‍රමානුකූල බහු භාර්යා විවාහය බවට පත් කළ ආඩම්බරය ඉස්ලාමය සතු වේ.

විවාහයේ වැදගත් කම පිළිබඳව හා එහි නීති රීති පිළිබඳව පෙර පාඩමේ දී අපි දැන ගත්තෙමු. ඉස්ලාමයේ විවාහ කර ගැනීම අනුමත කර ඇති ආකාරයෙන් ම විවිධ සාධාරණ හේතූන් මත බහු භාර්යාවන් විවාහ කර ගැනීමට ද ඉස්ලාම් අනුමත කරයි.

පිරිමියෙකු එක ම අවස්ථාවේ කාන්තාවන් කිහිප දෙනෙකු නීත්‍යානුකූල භාර්යාව වශයෙන් තබා ගැනීම බහු භාර්යා විවාහය නම් වේ. අල්කුර්ආනය පහළ කිරීමට පෙර ද බහු භාර්යා විවාහය දක්නට ලැබුණි. තව ද පිරිමියෙකු තමන් කැමති ඕනෑම ප්‍රමාණයක් කාන්තාවන් විවාහ කර ගන්නා සිරිතක් ද තිබිණි. පෙර නබි වරුන්ගේ ඉතිහාසය තුළින් මේ බව සනාථ කළ හැක. ඉබ්‍රාහිම් අලෛහිස්සලාම් යඃකූබ් අලෛහිස්සලාම්, දාවූද් අලෛහිස්සලාම් තුමා, සුලෛමාන් අලෛහිස්සලාම් තුමා යන නබිවරුන් බහු විවාහයන් කළ බවට ඉතිහාසය සාක්ෂි දරයි.

මේ හැර නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට පෙර අවධියේ ද මෙකී බහු භාර්යා විවාහය බහුලව තිබිණි. කයිලාන් අස්සකෆි නැමැත්තා ඉස්ලාමය වැළඳගන්නා අවස්ථාවේ දි කාන්තාවන් දස දෙනෙක්ව විවාහ කරගෙන සිටියේ ය. පසුව එම කාන්තාවන් අතරින් සිව් දෙනෙකු තෝරා ගෙන ඉතිරි අය ඉවත් කරන ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඔහුට උපදෙස් දුන්නේ ය.

මෙලෙස බලන විට සීමාවක් නොමැතිව දක්නට තිබුණු බහු විවාහ ක්‍රමය, ඉවත් කොට, ස්ත්‍රීන් සිව් දෙනෙක් පමණක් එක් පිරිමියෙකුට විවාහ කර ගත හැකි බවට සීමාවක් පනවන ලදී. මෙම අනුමැතිය ද විවිධ කොන්දේසින් මත අනුමත කර ඇති අතර "එම කාන්තාවන් අතර සමානාත්මතාවකින් යුතු ව කටයුතු කළ යුතුයි" යන කොන්දේසිය ද පනවන ලදී.

### බහු භාර්යා විවාහ හා එහි ප්‍රයෝජන

යමෙක් බහු භාර්යා විවාහය මඟින් සිය කායික අවශ්‍යතාවයන් පමණක් ඉටුකර ගැනීම ඉස්ලාමයෙහි අරමුණ නොවේ. මේ වෙනුවට මෙම විවාහය මඟින් ස්ත්‍රී පුරුෂ

යන දෙපාර්ශවයට ම විවිධ ප්‍රයෝජනයන් සඳහා මග සලසා ඇත. මෙම බහු විවාහය සඳහා වූ පහත සඳහන් සාධාරණ හේතු කෙරෙහි අවධානය යොමු කර ඇත.

(1). හිජ්රි 3 දි ඇතිවුණු උහද් සටනේ දී මුස්ලිම්වරු බොහෝ දෙනෙක් ෂහීද් වූහ. මේ හේතුවෙන් බොහෝ අය වැන්දඹුවන් බවට ද, අනාථයන් බවට ද පත් වූහ. මෙවැනි අය රැක බලා ගැනීම ද ඔවුන්ට උපකාර ලබාදීම ද, මුස්ලිම්වරුන්ගේ වගකීමක් බවට පත් විය. මේ අවස්ථාවේ දී බහු භාර්යා විවාහය අනුමත කරමින් අල්කුර්ආනය මෙසේ පවසයි. " ස්ත්‍රීන් අතරින් ඔබට රිසි අය දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ සිව්දෙනෙක් වශයෙන් ඔබ විවාහ කර ගන්න. (නමුත්) ඔවුන් සම්බන්ධයෙන් ඔබට සාධාරණව ක්‍රියා කිරීම අසීරු යැයි බියක් ඇත්නම් එක් ස්ත්‍රියක් පමණක් විවාහ කරගන්න." (04:03)

(2). යමෙකුගේ බිරිඳ නිදන්ගත රෝගයකින් රෝගාතුරව සිටීනම් හෝ ඇය සමඟ පවුල් ජීවිතය ඉදිරියට කරගෙන යාමට නොහැකි නම්, තව විවාහයක් කරගත හැක. මෙමගින් පාපී ක්‍රියාවලින් ආරක්ෂා වීමටත් හැකි වේ. මේ අනුව බහු විවාහය, අල්ලාහ් මිනිසාට ලබාදුන් දයාද අතරින් එකකි.

(3). බහු භාර්යා විවාහය තුළින් විවිධ පවුල් අතර අලුත් නෑ සබඳකමක් ගොඩ නැංවේ. මෙපමණක් නොව මිනිස් සංහතියේ වර්ධනයට ද මග පාදයි.

**තවත් සමහර ප්‍රයෝජන පිළිබඳ කෙටියෙන් සලකා බලමු.**

* වැන්දඹුවන් සඳහා නව ජීවිතයක් ලබා දීම හා පාපී ක්‍රියාවල්වලින් ආරක්ෂා වීමට හැකි වීම.
* අනාථ දරුවන්ට රැකවරණය ලබාදීම ට හැකි වීම.
* වැරදි කාමුක හැසිරීම් වලින් පිරිමි රැක ගැනීමට හැකි වීම.
* පිවිතුරු ඉස්ලාමය හැර යාමෙන් ආරක්ෂා කරගැනීමට හැකිවීම.
* ඉස්ලාමයට පෙර කාලයේ බහු භාර්යා විවාහය තුළින් කාන්තාවන්ට විවිධ අකරතැබ්බවලට මුහුණ දීමට සිදුවිය.ඒවායින් ආරක්ෂා වීමට හැකි වීම.
* ඉස්ලාම් බහු විවාහ ක්‍රමයට යම් සීමාවක් පැනවූ අතර ස්ත්‍රීන්ගේ ජීවිතයේ ආරක්ෂාව ද සහතික කිරීමට හැකි වීම.
* ආර්ථික වාසියක් ලැබීම.

**අභ්‍යාස**

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් කොපමණ කාන්තාවන් විවාහ කරගත්තේ ද?

2. බහු විවාහය මගින් අත්වන සමාජයීය ප්‍රයෝජන කවරේ ද?

3. ඉස්ලාමයට පෙර දක්නට ලැබුණු බහු විවාහය හා ඉස්ලාමයට පසුව හඳුන්වා දුන් බහු විවාහය අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

## 4.4 තලාක් (දික්කසාදය)

- විවාහ දිවියට පිවිසි බිරිඳ හා සැමියා සාධාරණ හේතුවක් මත ඉන් මිදීමට අල්ලාහ් ලබාදුන් සහනය "තලාක්" වේ.
- කෙනෙකු තලාක් කිරීමට පෙර සමාදනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඉස්ලාමය උපදෙස් දෙයි.
- තලාක් කරනු ලැබූ ස්ත්‍රියක් එහි ඇති නීති රීතීන් පිළිපැදීම අනිවාර්ය වේ.
- තලාක් යනු එක් අවසන් ප්‍රතිකාරයක් හැර කාන්තා පක්ෂයට අසාධාරණ ඇති කරන්නා වූ මාර්ගයක් නොවේ.

විවාහ බන්ධනය මගින් එක් පිරිමියෙක් හා ස්ත්‍රියක් සතුටුදයක ජීවිතයක් ගත කිරීම ඉස්ලාම්හි අරමුණ වේ. ඉස්ලාම් මේ සඳහා විවිධ කොන්දේසින් පනවා ඇත්තේ මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිසය. විවාහය තුළින් සෙනෙහස, ආදරය හා අන්‍යොන්‍ය අවබෝධය යනා දී ලක්ෂණයෙන් පවුල් ජීවිතය පිරී තිබිය යුතු බව ඉස්ලාම් බලාපොරොත්තු වේ. නමුත්, කෙනෙක් තුළ ඇතිවන්නාවූ කෝපය යන දුර්ලක්ෂණය මගින් ඉහත සඳහන් බලාපොරොත්තු ඉටු කරගැනීමට නොහැකි වේ. පවුල් ජීවිත සම්පූර්ණයෙන් ම කඩා බිඳ වැටේ. මෙවැනි අවස්ථාවල දී සමාදන මාර්ගය අනුගමනය කරන ලෙස ඉස්ලාම් අණ කරයි.

"සිය සැමියා තමන් පිළිකුල් කරතැ 'යි නැත්නම් නොසළකා හරිතැ 'යි බිරිඳක් සිතනවා නම් ඒ දෙදෙනා තම තමන් අතර සමගි සම්පන්න එකඟතාවයක් ඇති කර ගැනීමෙහිලා වරදක් නැත. සමාදනය ඉතා ශ්‍රේෂ්ඨ වේ. (4 : 128)

"සැමියා සහ බිරිඳ යන දෙදෙනා අතර ඇතිවන්නා වූ ක්‍රෝධය පවුල් ජීවිතය බිඳ දැමීමට හේතුවක් නොවිය යුතු ය. යන්න ඉස්ලාමයේ බලාපොරොත්තුව වේ. යම් පවුලක් තුළ එවැනි ප්‍රශ්න මතුවන විට ගත යුතු මූලික පියවර කුමක් ද? යන්න අල්කුර්ආනය පැහැදිළිව අවධාරණය කරයි.

"දෙදෙනා අතර ගැටුම් ඇතිවනු ඇතැයි ඔබ සැක කරනවා නම් ඔහුගේ පවුලෙන් මැදිහත්කරුවෙකු සහ ඇයගේ පවුලෙන් මැදිහත්කරුවෙකු යවන්න. ඒ දෙදෙනා අතර සමාදනය ඇති කරන්නට තැත් කළා නම් අල්ලාහ් ඒ දෙදෙනාට ම පිහිට වන්නේ ය.
(4 : 35)

ඉහත සඳහන් උත්සාහයන් අසාර්ථක වූ විට අනුගමනය කරන්නා වූ අවසාන පියවර තලාක් වේ. එනම්, විවාහයෙන් දික්කසාද වීමයි. ඉස්ලාම් මෙය එතරම් ප්‍රිය නොකළත් අවසාන පියවරක් වශයෙන් මෙය අනුගමනය කිරීමට අනුමත කරයි. මේ පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

"අල්ලාහ් අනුමැතිය දී තිබෙන දේ අතරින් අල්ලාහ් තආලාට ඉතාමත් පිළිකුල් සහගත වන්නේ තලාක් ය" (අබූ දාවූද්)

## දික්කසාදය ක්‍රම 03 කින් සිදුවේ

1). **තලාක්**
2). **ෆස්හු**
3). **කුල්උ**


### 1). තලාක්

ස්වාමි පුරුෂයා සිය බිරිඳ විවාහ බන්ධයෙන් නිදහස් කිරීමේ ක්‍රමය තලාක් වේ. විවිධ සාධාරණ හේතුන් මත බිරිඳට අසාධාරණයක් නොවන සේ සමාදානව ප්‍රශ්න විසඳාගැනීමට නොහැකි වූ අවස්ථාවේ දී දික්කසාද කිරීමට අනුමත කර ඇත. මෙය පිරිමින්ට ලබාදී ඇති අයිතියකි. මෙසේ තලාක් කිරීමේ දී තෙවතාවක් තලාක් කීමට හෝ ලිඛිතව ඉදිරිපත් කිරීමට හැකි ය.

"තලාකය දෙවරකි. සිරිත් අනුව තලාක් ලත් ස්ත්‍රීන් රඳවා ගත යුතු ය, නැතහොත් හොඳින් මුදා හැරිය යුතු ය. අල්ලාහ්ගේ අණපනත් පිළිබඳව සීමාවන් ඔවුන් දෙදෙනාම රකින්නට නොහැකි යැයි යන බියකින් විනා ස්ත්‍රීන්ට ඔබ දුන් දෙයින් යමක් ඔබ ගැනීම ඔබට තහනම් ය. ඔවුන් දෙදෙනා අල්ලාහ්ගේ අණ පනත් පිළිබඳ සීමාවන් රකින්නේ නැතැයි පංචායත්වරුන් වන ඔබ බිය වේ නම් ස්ත්‍රීන් දුන් දෙය පුරුෂයා විසින් පිළිගැනීම ඔවුන් දෙදෙනාහට ම වරදක් නොවේ. ඒවා අල්ලාහ්ගේ සීමාවන් ය. එම සීමා නොඉක්මවන්න. යම් කෙනෙක් අල්ලාහ්ගේ සීමාවන් ඉක්මවන්නේ නම් ඔවුහු වරදකරුවෝ වෙති " (2:229)

- ♦ යම් ස්ත්‍රියක් මාස්ශුද්ධි කාලයේ දි දික්කසාද කිරිම හා එකවර තලාක් තුනම පැවසීම තලාකුල් බිදඉ යනුවෙන් හඳුන්වනු ලබයි.
- ♦ මාස් ශුද්ධියෙන් පිරිසිදුව සිටිනවිට සංසර්ගයේ නොයෙදී පළමු, දෙවන හා තෙවන මාස වල පවසන ලද දික්කසාදය තලාක් සුන්නි වශයෙන් හැඳින් වේ.

### තලාක් හි වර්ග :



## තලාක් රජ්ඊ

මෙහි අදහස මිදිය හැකි තලාක් යන්නයි. සැමියෙක් තමාට අනුමත කරන ලද තලාක් තුනකින් එක් තලාකයක් පවසා ඉද්දා කාලය අවසන් වීමට පෙර සිය බිරිඳ සමග නැවතත් එක් විය හැකි ය. මෙය රජ්ඊ යනුවෙන් හැඳින් වේ. මෙසේ තලාක් පවසන ලද කාන්තාවන්ගේ ඉද්දා කාලය අවසන්වූවොත් මෙය අල් බයිනුනා සුග්රා යන සුළු වෙන් වීම් යනුවෙන් හැඳින්වේ. එම සැමියා නියමිත කාන්තාව නැවත එක්කර නොගත්විට වෙනත් කෙනෙකුට ඇය විවාහ කර ගත හැකි ය. එක්කර ගන්නවානම් මහර් දී අලුතෙන් නිකාහ් කිරීම අවශ්‍යය.

## තලාක් බායින්

යම් කෙනෙක් සිය බිරිඳ තලාක් තුනම පවසා අවසන් කිරිම මගින් මෙම තත්වය උදාවේ. ඉහත සඳහන් තලාක් මෙන් එක්වරක් තලාක් පවසා සිය බිරිඳ නැවත තමන් සතු කරගත් සැමියාට ඉතිරිව ඇත්තේ තවත් අවකාශ දෙකකි. තලාක් දෙකක් පැවසූ කෙනෙකුට ඉතිරිව ඇත්තේ එක් අවකාශයකි. අවසාන ලෙස ඔහු එම තලාකය ද ප්‍රකාශ කළවිට එම කාන්තාව සම්පූර්ණයෙන් ම වෙන්ව ගිය තැනැත්තිය ලෙස සැළකේ. ඇය ඔහුගේ බිරිඳ යන තත්වයෙන් මිදී ඉද්දා කාලය අවසන් වූ පසු වෙනත් පුරුෂයෙකුව විවාහ කරගැනීමට අයිතිය ඇත. මෙය මහා වෙන්වීම් යන අත් තලාක් අල් බායින් වශයෙන් සැළකේ.

## ෆස්කු

ඉස්ලාමීය විවාහයක දී තිබිය යුතු කොන්දේසීන් පිළිබඳව අපි දැනගත්තෙමු. මේ යටතේ යම් විවාහ ගිවිසුමක දී කොන්දේසින් අසම්පූර්ණ වූ විට හෝ ඉන් එකක් නොමැති වූ විට දීත් විවාහය සිදු වූවා නම් නියමිත සැමියා හා බිරිඳ වෙන් කිරීමට සිදු වේ. උදාහරණ වශයෙන් එක් මුස්ලිම් පිරිමියෙකු මුස්ලිම් නොවන කාන්තාවක්, මුස්ලිම් කාන්තාවක් ලෙස සිතා විවාහ කරගෙන පසුව එය හෙළි වූ විට එම දෙදෙනා වෙන්කර විවාහ ගිවිසුම අවලංගුකිරීම ෆස්කු වේ. මෙලෙසම තමන් විවාහ කරගෙන සිටින්නේ තමාට මහ්රම් වූ කාන්තාවක් යන්නෙන් ද දැනගත් විට විවාහ බන්ධනයෙන් වෙන් වේ.

## කුල්උ

එක් ස්ත්‍රියක් සිය සැමියා වෙතින් යහපත් ජීවිතයක් බලාපොරොත්තු වේ. ඒ සමගම සිය පවුල් ජීවිතය අප්‍රිය වූ ආරවුල් සහිත එකක් වීම කිසිසේත් ම ඇය ප්‍රිය නොකරයි. සමහර අවස්ථාවල දී ඇය මනාප වන, සතුටු දායක ජීවිතයක් නොලැබී යාමට ඉඩ ඇත. අශිලාචාර සැමියාගේ මත්පැන්, සූදුව, සුරාව වැනි ක්‍රියා මගින් සිය පවුල් ජීවිතය විනාශයට පත් වේ. එම සැමියා නිවැරදි කිරිමට ඇය ගන්නා වූ ප්‍රයත්නයන් අසාර්ථක වූ විට බිරිඳ කාදිවරයා වෙත ගොස් පැමිණිලි කර සැමියාට යම් වන්දි මුදලක් ගෙවා නිදහස් වීම කුල්උ වශයෙන් හැඳින් වේ.

## 4.5 ඉද්දා

- "ඉද්දා" යන පදය ගණනය කිරීම යන අර්ථය දෙයි.
- සැමියාගේ මරණය හෝ දික්කසාදය හේතුකොට ගෙන නියමිත කාලයක් සමහර කෙන්දේසිවලට අවනතව කටයුතු කිරීම ඉද්ද වේ.
- ඉද්දවේ කාල සීමාව අල්ලාහ් තීරණය කොට ඇත. එය වෙනස් කිරීමේ බලය කිසිවෙකුට නොමැත.

පෙර පාඩමෙහි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට ම අයත් දික්කසාදය, තලාක්, කුල්උ හෝ ෆස්කු යනා දී තුනකින් එකකට අයත් වන බව දැනගත්තෙමු. ඉද්දා යනු ගණනය කිරීම හෝ ගණන් කිරීම යන අදහස ගෙන දේ. සැමියා මියගිය කාන්තාව හෝ දික්කසාද වූ කාන්තාව ඉද්දා අනුගමනය කිරීම අනිවාර්ය වේ.

### ඉද්දා සිටීමේ අරමුණු

- ඉද්දා සිටීම අල්ලාහ්ගේ අණට කීකරු වීමකි.
- ඉද්දා සිටීම තුළින් යම් කාන්තාවක් ගර්භණී තත්වයට පත්ව ඇත්දැයි දැනගත හැකි ය.
- තලාක් රජ්ඊ අවස්ථාවේ දී ඉද්දා සිටින කාන්තාව නැවතත් සැමියා තමන් සතු කරගැනීමට අවකාශ ලැබේ.

### තලාක් කියන ලද කාන්තාවගේ ඉද්දා

තලාක් කියන ලද කාන්තාව තලාක් කියන ලද දිනයේ සිට පිරිසිදු කාල තුනක් ඉවසා සිටිය යුතු ය. මේ පිළිබඳව අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.

"තවද, තලාක් පවසන ලද කාන්තාවක් මාස 3ක් ඔසප් සිදුවන තාක් තමන් ඉවසා සිටිය යුතු ය. මොවුන් අල්ලාහ්ව හා අවසාන දිනය පිළිබඳව විශ්වාස කරන්නාහු නම් මොවුන්ගේ ගර්භයන්හි අල්ලාහ් මවා ඇති දේ වසන් කිරීම මොවුනට අනුමත වූවක් නොවේ. තවද (මිදිය හැකි තලාක් පවසන ලද) ඔවුන්ගේ සැමියන් එක්වීම ප්‍රිය

කළහොත් එම නියමිත කාලය තුළ දී මොවුන්ව (බිරිඳ ලෙස) නැවත එක්කර ගැනීමට අයිතිය ඇත්තේ ය. (බිරිඳ වන) මොවුන් කෙරෙහි ඇති වගකීම් ලෙස ම මොවුනට නියම ආකාරයෙන් අයිතීන් ද ඇත. පිරිමින්ට ද, (ස්ත්‍රීන් වන) මොවුන් කෙරෙහි (වගකීම්) මට්ටමක් ඇත. අල්ලාහ් (සියල්ලක් ම) අභිබවා සිටින්නාය. මනා නුවණ ඇත්තාය.” (2:228)

## සැමියා අහිමි වූ කාන්තාව

ඇය සිව්මසක් හා දින දහයක් ඉවසා සිටිය යුතුයි. ගැබිනි මව්වරුන් දරු ප්‍රසූතිය දක්වා ඉවසා සිටිය යුතුයි.

යම් ස්ත්‍රියකට සිය සැමියා මිය ගිය පණිවිඩය ලැබුණු ද සිට නියමිත දිනයන්හි ඉතිරිව ඇති කාලය ඉද්දා සිටිය යුතු ය. එම නියමිත කාලය අවසන් වූ පසු එම පණිවිඩය ලැබුණේ නම්, එම ස්ත්‍රිය ඉද්ද සිටීමට අවශ්‍ය නැත. ඉද්දා සිටින කාලය තුළ රෝගාතුර වූ විට වෛද්‍යවරයා වෙත යාම, හදිසි අනතුරුවල දී තමාව හෝ සිය දරුවන්ව ආරක්ෂා කර ගැනීම වැනි ඉතා අත්‍යවශ්‍ය අවස්ථාවල එම කාන්තාව විධිමත්ව නිවසින් පිට වී යාම වරදක් නොවේ. සැමියා මිය ගිය කාන්තාව ඉද්දා සිටින කාලය තුළ පහත සඳහන් කරුණුවලින් වැලකී සිටිය යුතු ය.

- තමන්ව අලංකාර කර ගැනීම.
- සුවඳ විලවුන් තවරා ගැනීම
- ආභරණ පැළඳීම
- විවාහ වීම හා විවාහ සම්බන්ධ කටයුතුවල නිරත වීම.

### අභ්‍යාස

1. ඉද්දා යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

2. ඉද්දාහි වර්ග සඳහන් කර එම අවස්ථාවේ දී වැලකී සිටිය යුතු කරුණු පිළිබඳව පැහැදිලි කරන්න.

3. ඉද්දාහි අරමුණු කවරේ ද?